# රියදුරු සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවීම

1.0 ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පවතින රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා නිලධරයන් බඳවාගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 වෘත්තිය පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව, පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ඒකාබද්ධ රියදුරු සේවයේ III,II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 3-2016 රු. 25,790-10x270-10x300-10x330-12x350-38,990/- වේ. රු. 28,790/- න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 31,820/- න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 35,140/- න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

6.0 සුදුසුකම් :- රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවාගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දි දෙවරකට නොවැඩි වාර ගණනක දි යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

(ආ) වෘත්තිය සුදුසුකම්

(i) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවාගන්නා දිනට වසර තුනක (3) ට පෙර අවම වශයෙන් සි සහ සි1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය)

(ii) මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

(ඇ) පළපුරුද්ද

වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

(ඈ) කායික සුදුසුකම්

අවම උස අඩි 05ක් විය යුතුය.

දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

(ඉ) වෙනත් සුදුසුකම්

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(ඊ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

7.0 අයදුම්පත් කැඳවීම

පහත වගුවේ සඳහන් පරිදි පවතින රියදුරු සේවයේ දක්වා ඇති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවේ.

| අමාත්‍යාංශය | තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|---|
| 1. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | රියදුරු සේවයේ III ශ්‍රේණිය | 16 |

8.0 වෘත්තිය පරීක්ෂණය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. වෘත්තිය පරීක්ෂණයේ දි අයදුම්කරුවන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර වෘත්තිය පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

වෘත්තිය පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| (i) | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| (ii) | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| (iii) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

9.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේ දි ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දි යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2016.10.28 වේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"රියදුරු සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම"** යන්න සඳහන් කරන්න.

11.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත 2016.10.28 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් වෘත්තිය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම් පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග පරිදි

.........................................

ලේකම් වෙනුවට

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ඒ. ඇම්. අසංග දයාරත්න
අතිරේක ලේකම් (පාලන)
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
" මිලෝදා " (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල)
පළමු මහළ, බ්‍රිස්ටල් වීදිය, කොළඹ - 01.

2016 ඔක්තෝබර් මස 13 දින

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
" මිලෝදා " (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල), පළමු මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.
දු.අ. 011-4461500/011-4461602 ෆැක්ස් : 011-2326080